00411

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී(ගෞරව) උපාධි පාඨමාලාව - තුන්වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2023/2024
LLU3406 - ව්‍යවස්ථා හා ලේඛන අර්ථනිරූපණය
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2025.05.18 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30

---

මුළු ප්‍රශ්න ගණන- 08
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. පර්ල් රාජ්‍යයේ 2008 ජාතික පාරිසරික ආරක්ෂණ පනතේ පහත පරිදි දක්වා ඇත.

1 වන වගන්තිය : මහජනතාවට ප්‍රවේශ විය හැකි ඕනෑම ස්ථානයකට හිතාමතාම අපද්‍රව්‍ය පහත හෙලන, බිම දමන හෝ වෙනත් ආකාරයකින් තැන්පත් කරන සහ පරිසරයට අපද්‍රව්‍ය මුදා හරින ඕනෑම දෙයක් බැහැර කරනු ලබන ඕනෑම පුද්ගලයෙකු වරදකරුවෙකු වේ.

ශාමා යනු පර්ල් රාජ්‍යයේ ජාතික කලා පාසලේ ගුරුවරියක වන අතර ඇයට වහලය විවෘත කළ හැකි (පරිවර්තනය කළ හැකි වහලයක් සහිත) මෝටර් රථයක් හිමිය. ඇය, වහලය විවෘතව තබා ගෙන තම මෝටර් රථය ධාවනය කරන අතරතුරදී, සිසුන් පිරිසකගේ පෙරපුහුණු විභාග ප්‍රශ්න පත්‍ර රථයෙන් ඉවතට විසි වී ගියේය. ඇය තම මෝටර් රථය නවතා පාර අයිනේ තිබී සොයා ගත හැකි තරම් වූ ප්‍රශ්න පත්‍ර එකතු කර ගත්තාය. කෙසේ නමුත් තවත් පිළිතුරු පත්‍ර කට්ටලයක් නැතිවී තිබූ අතර ඒවා අසල ඇති ඝන කටු පඳුරකට විසි වී තිබුණි. පනතේ 1වන වගන්තිය යටතේ ශාමාට නඩු පවරනු ලැබීය.

2008 ජාතික පාරිසරික ආරක්ෂණ පනත යටතේ තමා යම් වරදක් සිද්ධ කර ඇත්දැයි දැන ගැනීමට ශාමා ඔබේ උපදෙස් පතයි.

අර්ථනිරූපණ රීති මත පදනම් වෙමින් ශාමාට උපදෙස් දෙන්න.

(ලකුණු 20)

02. "අර්ථනිරූපණය යනු ව්‍යවස්ථාවන් ලෙසින් දක්වා ඇති නීති සම්පාදන ආයතනයේ අභිප්‍රායන් යතාර්ථවාදී සහ නිවැරදි ආකාරයෙන් අර්ථනිරූපණය කිරීමේ ක්‍රියාවලියයි."
Von Glasersfeld, E.(1983) *On the concept of interpretation. Poetics,* 12(2-3), 207-218
ඉහත දී ඇති ප්‍රකාශය ඇසුරින් ව්‍යවස්ථා අර්ථනිරූපණයේ වැදගත්කම සහ ව්‍යවස්ථාදායකයේ චේතනාව සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර සුදුසු නිදර්ශන සහ නඩු නීතිය ඇසුරෙන් සාකච්ඡා කළ යුතු වේ.

(ලකුණු 20)

03. සෙලෝනිකා රාජ්‍යයේ 1985 අංක 02 දරණ නීති විරෝධී අවිආයුධ පනතේ පහත සඳහන් ප්‍රතිපාදනය අඩංගු වේ.

3වන වගන්තිය: පොදු සාප්පු සංකීර්ණ ලෙස නම් කර ඇති පරිශ්‍රයන්හි කිසිදු පුද්ගලයෙකුට අවි ආයුධ තබා ගැනීමට අවසර නැත. මෙම පනතේ 3වන වගන්තිය උල්ලංඝණය කිරීම පනතේ 5වන වගන්තිය ප්‍රකාරව වරදකි.

මෙම පනතේ අරමුණ සඳහා 'ආයුධයක්' යන්නට ඕනෑම පුද්ගලයෙකුට මරණය, තුවාල හෝ හානියක් සිදු කිරීම සඳහා භාවිතා කරන ලද හෝ භාවිතා කිරීමට අදහස් කරන ඕනෑම වස්තුවක්, උපාංගයක් හෝ ද්‍රව්‍යයක් ඇතුලත් වේ.

පනතේ පූර්විකාව ප්‍රකාරව නීති විරෝධී අවි ආයුධ අත්පත් කර ගැනීම, ප්‍රවාහනය, භාවිතය හෝ සැපයීම සහ එමගින් වෙනත් ක්‍රියාවන් හෝ දේවල් සිදුකිරීම සම්බන්ධව රෙගුලාසි දැක්වීම පනත මගින් සිදුවේ.

වෘත්තියෙන් කාර්මික ශිල්පියෙකු වන වික්, ඩන්ලොක් සාප්පු සංකීරණයේ වාර්ෂිකව පැවැත්වෙන වසර අවසාන ප්‍රදර්ශනයට ඇතුලුවන අතරතුරදී කඩදාසි කපනයක් (Paper cutter) සහ බ්ලේඩ් තලයක් (blade) අතැතිව හමුවෙයි. සාප්පු සංකීර්ණයේ ආරක්ෂිත නිලධාරීන් පවසන්නේ පූර්ව දැනුම්දීමකින් තොරව සාප්පු සංකීර්ණයට ආයුධ ගෙන ඒම වරදක් බවයි. කෙසේ නමුත්, වික් පවසා සිටින්නේ කඩදාසි කපනය සහ බ්ලේඩ් තලය නීති විරෝධී අරමුණක් හෝ කටයුත්තක් සඳහා තමා සන්තකයේ තබා නොගත් බවත් ඒවා ඔහුගේ රැකියාව හා බැඳුණු උපකරණ පමණක් බවත් ය.

මෙම නඩුවේ විනිසුරු ඔබ යැයි උපකල්පනය කරන්න.මෙම නඩුවේදී 1985 අංක 02 දරණ සෙලෝනිකාවේ නීතිවිරෝධී අවි ආයුධ පනත ඔබ අර්ථකතනය කරන්නේ කෙසේද? ව්‍යවස්ථාපිත අර්ථනිරූපණය සඳහා යොදා ගන්නා විවිධ ප්‍රවේශයන් සහ අදාළ නඩු නීතිය භාවිතා කරමින් ඔබේ පිළිතුර පැහැදිළි කරන්න.

**(ලකුණු 20)**

04. (අ) 'Ejusdem generis' සහ 'Noscitur a sociis' යන රීතීන් සැලකිය යුතු ලෙස සමාන වන නමුත් ඉතා සිහින් ස්ථරයකින් වෙන් කර දැක්විය හැකිවේ. පැහැදිළි කරන්න.

**(ලකුණු 10)**

(ආ) "මෝටර් රථ, ට්‍රක් රථ සහ අනිකුත් මෝටර් බලයෙන් ක්‍රියාත්මක වන වාහන සඳහා 2025 මැයි මස සිට බදු අය කිරීමකට යටත් වේ." යනුවෙන් ව්‍යවස්ථාවක දක්වනු ලබයි. අරුන් හට පාපැදියක් හිමිය. අරුන් බදු ගෙවීමට යටත් වේද? පැහැදිලි කරන්න.

**(ලකුණු 05)**

(ඇ) නගර සීමාව තුළ බල්ලන්, බළලුන්, වඳුරන් සහ අනිකුත් සතුන් හට ආහාර ලබා දීම නාගරික ආඥා පනතකින් තහනම් කර ඇත.
ටීනා කපුටන්ට ආහාර ලබා දෙයි. පැහැදිලි කරන්න.

**(ලකුණු 05)**

05. "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු රටේ පවතින උත්තරීතර නීතිය ලෙස පිළිගනු ලබන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් සාමාන්‍ය නීතීන් ඒවායේ වලංගුභාවය ලබා ගනී. සාමාන්‍ය නීතීන්හි පවතින ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇසුරෙන් අර්ථනිරූපණය කළයුතු වේ. එසේම, සාමාන්‍ය නීතීන් හි පවතින ප්‍රතිපාදන වලට පැහැදිළි දැක්මක් ලබා දීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව භාවිතා කළ යුතුවේ."
Per Justice Eva Wanasundara in *AG* v *Ambagala Mudiyanselage Samantha Sampath* [ SC Appeal No. 17/2013] p8

(අ) ඉහත ප්‍රකාශය අනුසාරයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්ථනිරූපනයේදී ශ්‍රී ලංකා අධිකරණයේ කාර්යභාරය අගයන්න. අදාළ නඩු තීරණ කෙරෙහි අවධානය යොමු කරමින් ඔබේ පිළිතුර ගොඩනැඟිය යුතුය.

(ලකුණු 12)

(ආ) ශ්‍රී ලංකාවේ අධිකරණ ප්‍රවේශය ඔබ කැමති තවත් අධිකරණ බල ප්‍රදේශයක් සමඟින් සසඳන්න.

(ලකුණු 08)

06. තාක්ෂණික අධ්‍යාපන ආයතන වලින් 50%ක අවස්ථා ප්‍රමාණයක් එහි වෙසෙන සියලු පදිංචිකරුවන් සඳහා වෙන් කිරීමට ඩයමන්ඩ් දූපතේ මධ්‍යම රජය විසින් තීරණය කරන ලදී. මධ්‍යම රාජ්‍යය අධ්‍යාපන පාලක පනතේ 8වන වගන්තිය ප්‍රකාරව, ස්ථිර වාසය යනු: "මධ්‍යම රාජ්‍යයේ වසර 5ක් ජීවත් වන සෑම පුද්ගලයෙකුම වේ." මාරි යනු, වසරකට මාස 3ක් පමණක් මධ්‍යම රාජ්‍යයේ ජීවත් වන සහ ඒ අයුරින් වසර 7කට වැඩි කාලයක් එහි රැඳී සිටින පුද්ගලයෙකි. වැඩිදුර අධ්‍යාපනය හැදෑරීමේ අරමුණින් යුතුව මාරි මධ්‍යම රාජ්‍යයෙන් ස්ථිර පදිංචිය සඳහා ඉල්ලුම් කළේය. මධ්‍යම ප්‍රාන්තය තුළ වසර 5ක් අඛණ්ඩව රැඳී සිටීමේ නිර්ණායකය සපුරා නොමැති බව පවසමින් ඔහුගේ අයදුම්පත මධ්‍යම රජය විසින් ප්‍රතික්ෂේප කරන ලදී.
පනතේ පූර්විකාවේ මෙසේ සඳහන් වේ. "රාජ්‍යයේ පදිංචිකරුවන්ට පහසුකම් සැළසීම, සුරක්ෂිත කිරීම සහ පක්ෂපාතීත්වය සැපයීම සඳහා මෙම පනත පනවනු ලැබේ."
ව්‍යවස්ථාපිත අර්ථනිරූපණයේදී අදාළ කරගනු ලබන ආධාර සහ නඩු නීතිය උපයෝගී කරගනිමින් මාරිට උපදෙස් දෙන්න.

(ලකුණු 20)

07. 'පූර්ව නිගමන වූ කලී, එක්තරා වූ තත්ත්වයක් පිළිබඳව සෑම ප්‍රකාශනයක්ම ප්‍රතිවිරුද්ධ සාක්ෂි ඉදිරිපත් කරන තෙක් සළකා බැලිය යුතු ආකාරය ලෙස පූර්වයෙන් තීරණය කරන ලද තත්ත්වයන් පරාසයක් පිළිබඳව පිළිගත් අධිකරණමය දෘෂ්ටියයි.'

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද?
අධිකරණ කටයුතු වලදී තනි පුද්ගල අවශ්‍යතා ආරක්ෂා කිරීමේදී පූර්ව නිගමන භාවිතා වන ආකාරය සාකච්ඡා කරන්න.
අවම වශයෙන් පූර්ව නිගමන දෙකක් සහ අදාළ නඩු තීරණ යොදාගනිමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 20)

08. පහත ඕනෑම දෙකක් **(02)** පිළිබඳව කෙටිසටහන් ලියන්න.

(අ) ව්‍යවස්ථා අර්ථනිරූපණය සඳහා ආධාරකයක් ලෙස ශබ්ද කෝෂ,පෙළපොත් සහ අනෙකුත් සාහිත්‍ය මූලාශ්‍ර.

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්ථනිරූපණයේ විවිධ ප්‍රවේශයන්.

(ඇ) *මහජන බැංකුව එදිරිව රෝසි ජයසූරිය* [SC Appeal 156/2010].

(ඈ) අන්තර්ජාතික සම්මුතීන් අර්ථ නිරූපණය කිරීම.

(10x02=ලකුණු 20)

-සියලුම හිමිකම් ඇවිරිණි.-